මගේ අංකය:ජේඑස්සී/ඊජ්/ස්ථානමාරු/2025

සියලුම මහාධිකරණ විනිසුරුවරුන්,
දිසා විනිසුරුවරුන්, මහේස්ත්‍රාත්වරුන්,
ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර් හා අභියාචනාධිකරණයේ රෙජිස්ට්‍රාර් වෙත,

**<u>උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ සහ අධිකරණවල සේවයේ නියුතු සංවර්ධන නිලධාරීන්ගේ සේවයේ (ගිණුම් සහකාර, වැඩසටහන් සහකාර හා සංවර්ධන නිලධාරීන්ගේ සේවයේ) වාර්ෂික ස්ථානමාරු අභියාචනා - 2025</u>**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 111 ඌ (1) (ආ) ව්‍යවස්ථාවේ විධිවිධාන හා 2016.08.15 දිනැති අධිකරණ සේවා කොමිෂන් සභා තීරණය ප්‍රකාරව **2025.02.03** දින සිට ක්‍රියාත්මක වන පරිදි උපලේඛනගත රජයේ නිලධාරීන්ගේ සේවයේ සහ සංවර්ධන නිලධාරීන්ගේ සේවයේ (ගිණුම් සහකාර, වැඩසටහන් සහකාර හා සංවර්ධන නිලධාරීන්ගේ සේවයේ) නිලධාරීන් සඳහා ලබාදී ඇති ස්ථානමාරුවීම් සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද අභියාචනා පිළිබඳව සලකා බැලීමෙන් පසුව අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් මෙයට අමුණා ඇති 'ඇමුණුම- A' (Annexure- A) හි සඳහන් තීරණයන්ට එළඹ ඇත.

02. වර්තමාන සේවා ස්ථානයේ වසර 04 ක කාලයක් සම්පූර්ණ කරන ලද එක් එක් සේවාවන්ට අයත් නිලධාරීන්ගේ ඉල්ලීම් සලකා බලා ඔවුන් විසින් අයදුම් කරන ලද සේවා ස්ථානයක් හෝ ආසන්නතම සේවා ස්ථානයක් හැකිතාක් දුරට ලබා දීමට කටයුතු කර ඇත. කෙසේ වුවත් උග්‍ර සේවක හිඟය හේතුවෙන් වසර 04 ක කාලයක් සම්පූර්ණ කරන ලද නමුත් ඉහත පරිදි ක්‍රියා කිරීමට නොහැකි වී ඇති නිලධාරීන්ගේ ඉල්ලීම් නව බඳවා ගැනීම් වල දී ප්‍රමුඛතා පදනම මත සලකා බැලීමට සටහන් කරගෙන ඇත.

03. ස්ථාන මාරු අත්හිටුවීම් සම්බන්ධයෙන් මෙම ස්ථානමාරු අභියාචනා නියෝගයේ (ඇමුණුම - Aහි) විශේෂයෙන් සඳහන් කර ඇති පරිදි ක්‍රියා කළ යුතු වේ.

04. උපලේඛනගත රජයේ නිලධරයන්ගේ තනතුරු ආශ්‍රිතව අධිකරණවල දැනට පවතින උග්‍ර නිලධාරී හිඟය හැකිතාක්දුරට කළමනාකරණය වන පරිදි හා ඒ ඒ අධිකරණවල පවතින අනුමත කාර්ය මණ්ඩල, කාර්ය මණ්ඩල පුරප්පාඩු සහ ආදර්ශ අධිකරණ පිහිටුවීම් සහ විශේෂ පරිපාලන අවශ්‍යතාවයන් යනා දී අවස්ථානුගත තත්වයන් සැලකිල්ලට ගෙන දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් කරන ලද ඉල්ලීම් ද හැකිතාක් දුරට සලකා බලා ස්ථානමාරු කිරීම්/ ස්ථානමාරු අවලංගු කිරීම්/ ස්ථානමාරු අත්හිටුවීම් සිදු කර ඇත.

05. ස්ථානමාරුවීම් ලද ප්‍රසූත නිවාඩු ලබා සිටින නිලධාරිනියන් මුදා හැරීම සම්බන්ධයෙන් පහත පරිදි කටයුතු කළ යුතුය.

- වැටුප් සහිත ප්‍රසූත නිවාඩු ලබමින් සිටින නිලධාරිනියන් තව දුරටත් අඩ වැටුප් ප්‍රසූත නිවාඩු අයදුම් කරන්නේ නම්, අයදුම්පත්‍ර වර්තමාන සේවා ස්ථානයේ දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත ඉදිරිපත් කළ යුතුය.

- අඩ වැටුප් ප්‍රසූත නිවාඩු ලබමින් සිටින නිලධාරිනියන් තව දුරටත් වැටුප් රහිත ප්‍රසූත නිවාඩු අයදුම් කරන්නේ නම් අයදුම්පත්‍ර වර්තමාන සේවා ස්ථානයේ දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත ඉදිරිපත් කළ යුතුය.

- අඩ වැටුප් ප්‍රසූත නිවාඩු හෝ වැටුප් රහිත ප්‍රසූත නිවාඩු සම්බන්ධයෙන් වර්තමාන දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය.

- ඒ අනුව ප්‍රසූත නිවාඩු මත සිටින නිලධාරිනියන් ස්ථානමාරු නියෝග මත වර්තමාන සේවා ස්ථානයෙන් මුදා හැරිය යුත්තේ ඔවුන්ට අනුමත කරන ලද ප්‍රසූත නිවාඩු අවසන් කර වර්තමාන සේවා ස්ථානයේ සේවයට වාර්තා කිරීමෙන් පසුවය.

06. දැනට ප්‍රසූත නිවාඩු ලැබ සිටීම හේතුවෙන් ඉහත 04හි පරිදි කටයුතු කිරීමෙන් පසු නියමිත දින ස්ථානමාරු නියෝග ලද සේවා ස්ථානයේ රාජකාරි බාරගැනීම සඳහා වර්තමාන සේවා ස්ථානයෙන් මුදාහැරීමට නොහැකි වන අවස්ථාවන්හිදී එලෙස මුදාහැරීමට නොහැකි නිලධාරීන් කවුරුන්ද යන්න ස්ථානමාරු ලද සේවා ස්ථානයේ දෙපාර්තමේන්තු ප්‍රධානියාට පිටපතක් සහිතව මා වෙත දැන්වීමට කටයුතු කළ යුතුය.

07. දැනට සේවය කරනු ලබන ස්ථානයේ වසර හතරක (04) ක සේවා කාලයක් සම්පූර්ණ කර නොමැති නිලධාරීන්ට මෙම වාර්ෂික ස්ථානමාරු වෙනුවෙන් ගමන් වියදම් හිමිකම් ලැබෙන්නේ එම නිලධාරීන්ගේ ඉල්ලීමකින් තොරව සේවා අවශ්‍යතාවය මත අදාල ස්ථානමාරු නියෝග කර ඇත්නම් පමණි. දැනට සේවය කරනු ලබන ස්ථානයන්හි වසර හතරක (04) සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරීන්ට ආයතන සංග්‍රහයේ විධිවිධානයන්ට යටත්ව ගමන් වියදම් සහ සංයුක්ත දීමනා සඳහා හිමිකම් ලැබේ.

08. තවද අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද ස්ථානමාරු නියෝග අනුව ස්ථානමාරු නියෝග ලද සියලුම නිලධාරීන් (නිශ්චිත දිනයක් සඳහන් කර ඇති ස්ථානමාරු හැර) **2025.02.03** දින නව සේවා ස්ථානයේ රාජකාරී සඳහා වාර්තා කිරීමට හැකි වන පරිදි **අනුප්‍රාප්තිකයන් පැමිණෙන තෙක් රඳවා නොගෙන** වර්තමාන සේවා ස්ථානයෙන් **මුදා හැරීමට දෙපාර්තමේන්තු ප්‍රධානීන් කටයුතු කළ යුතු බවද** අධිකරණ සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි මෙයින් දැනුම් දෙනු ලැබේ.

අධිකරණ සේවා කොමිෂන් සභාවේ අණ පරිදි,

එච්.එස්.සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව

එච්. සංජීව සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව
කොළඹ 12

2025 ජනවාරි මස 24 වෙනි දින,
කොළඹ 12,
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේදී ය.